2022 දෙසැම්බර් මස 31 දිනට අවසන් වූ වර්ෂය සඳහා වන මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ ප්‍රාග්ධන වත්කම් 02 ක ප්‍රසම්පාදන වියදම් ලෙස රු. 5,497,585 ක් ලෙස පෙන්නුම් කර තිබුනද මහා භාණ්ඩාගාර ලේඛනය (SA 82) ප්‍රකාරව එය රු. 2,800,845 ක් ලෙස ප්‍රකාශ කර තිබීම හේතුවෙන් රු. 2,696,740 ක විෂමතාවයක් නිරීක්ෂණය වේ.

1.6.1.2 අත්තිකාරම් ගෙවීම

පහත කරුණු නිරීක්ෂණය විය

(අ) 2022 වර්ෂයේ අංක 31 දරන ප්‍රතිපාදන (සංශෝධන) පනත මඟින් ඉවත්කරන ලද අමාත්‍යාංශ සඳහා වන අත්තිකාරම් ගිණුම් ශේෂයන් ශේෂයක් නොමැති ලෙස සලකා අදාල නව අමාත්‍යාංශයට භාරදිය යුතු බවට සඳහන් කර තිබුණද ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය (409) සහ විදේශ රැකියා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය (412) හි පිළිවෙලින් මුළු එකතුව රු. 1,427,500 ක් වන අය ශේෂයක් සහ මුළු එකතුව රු. 1,687,703 ක් වන වැය ශේෂයක් මේ දක්වාම මහා භාණ්ඩාගාරය වෙත නිරවුල් කර නොතිබුණි.

(ආ) වැඩ තහනම් කරන ලද, සේවයෙන් විශ්‍රාම ගත්, සේවය අත්හැර ගිය, මියගිය නිලධාරීන්ගේ ණය ශේෂයන් පහක මුළු එකතුව රු. 157,960 ක් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් 2022 වර්ෂයේ දී කපා දැමීමට අනුමැතිය ලබා දී තිබුණද මේ දක්වාම කපාහැර නොතිබීම හේතුවෙන් රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ අයකර නොගත් ලෙස පෙන්නුම් කර තිබෙන බැවින් සමාලෝචිත වර්ෂයේ රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ ශේෂය රු. 157,960 කින් වැඩිපුර පෙන්නුම් කර ඇත.

1.6.2 අග්‍රිම ගිණුම

වෙනත් දෙපාර්තමේන්තු මගින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම වෙත නිරවුල් කර තිබූ ලැබීම් ශේෂය අග්‍රිම නිරවුල් කිරීමේ ගිණුමේ සඳහන් කර නොතිබූ අතර මහා භාණ්ඩාගාර ලේඛනය (SA 51) හි එය රු. 385,390 ක් ලෙස පෙන්නුම් කර තිබීම හේතුවෙන් රු. 385,390 ක විෂමතාවයක් නිරීක්ෂණය විය.

1.6.3 මූල්‍ය තත්ව ප්‍රකාශනය

1.6.3.1 මූල්‍ය නොවන වත්කම්

2022 දෙසැම්බර් 31 දිනට පැවති පරිදි මූල්‍ය තත්ව ප්‍රකාශනයේ පෙන්නුම් කර ඇති පරිදි මූල්‍ය නොවන වත්කම් මුළු එකතුව රු. 1,432,058,050 ලෙස තිබුනද සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් මුළු එකතුව රු. 1,454,597,866 ලෙසද පෙන්නුම් කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා වන මූල්‍ය තත්ව ප්‍රකාශනයේ මූල්‍ය නොවන වත්කම් මුළු එකතුව රු. 22,539,816 ක් අඩුවෙන් පෙන්නුම් කර ඇත.

1.6.3.2 අග්‍රිම ගිණුම් ශේෂ

සමාලෝචිත වර්ෂයේ 2022 ජූලි 04 දින දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් භාණ්ඩාගාරය වෙත නිරවුල් කර තිබූ රු. 27,158,000 ක අග්‍රිම ශේෂය සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ව ප්‍රකාශනයේ නිරවුල් නොවූ අත්තිකාරම් ශේෂයක් ලෙසත් මුදල් සහ මුදල් හා සමාන ලෙසත් වැරදි ලෙස සඳහන් කර තිබෙන බවට නිරීක්ෂණය විය.

1.6.4 විගණනය සඳහා ප්‍රමාණවත් තරම් ලිඛිත සාක්ෂි නොමැති වීම

සමාලෝචිත වර්ෂයේ දී දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් හරිත දේශයක් ගෙවතු වගා ව්‍යාපෘතිය, ග්‍රාමීය සංවර්ධන වැඩසටහන්, ප්‍රදේශීය සංවර්ධන වැඩසටහන් සහ ජීවනෝපාය මාර්ග සංවර්ධන වැඩසටහන් ආදිය කරුණු සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06

ක් මඟින් ගෙවීම් කර තිබූ රු. මිලියන 200.8 කින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් රු. මිලියන 1.4 ක වටිනාකමින් යුත් පලතුරු පැල, බීජ, එළවළු පැල සහ කෘෂි උපකරණ ආදිය ප්‍රසම්පාදනය කර ව්‍යාපෘති 139 ක් සඳහා ප්‍රදානය කර තිබේ කෙසේ වුවද මේ සඳහා අනුමත කරන ලද ප්‍රතිලාභීන්ගේ අයදුම්පත්, තෝරාගැනීමේ ක්‍රමවේදයන්, මූල්‍ය කාර්ය සාධන පරීක්ෂණ වාර්තා, වැඩසටහන් ප්‍රගති වාර්තා, බෝග ඵලදාව හෝ හානි, බෝග වගාව මඟින් අපේක්ෂිත අරමුණු සපුරා ගැනීම් සමාලෝචනය, උපකරණයන්හි ක්ෂයවීම් වාර්තාව ආදිය මේ දක්වා විගණනයට ඉදිරිපත් කර නොමැති බවට නිරීක්ෂණය වූ අතර අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් සිදුකරන ලද එවන් ගනුදෙනු සම්බන්ධ ලිපි ලේඛන ද විගණනයට ඉදිරිපත් කර නොමැති බැවින් විගණනයේ දී ඒ සම්බන්ධව තෘප්තිමත් ලෙස පරීක්ෂා කර සහතික කිරීමට නොහැකි විය.

1.6.5 <u>ලේඛන සහ පොත්පත් පවත්වාගෙන නොයෑම / යාවත්කාලීන නොකිරීම</u>

<u>අංකය</u>	<u>ලේඛන වර්ගය</u>	<u>නියමිත ප්‍රතිපාදනය</u>	<u>නිරීක්ෂණ</u>
(අ)	විදුලි උපකරණ පිළිබඳ ලේඛනය	මුදල් රෙගුලාසි 454(2)	පවත්වාගෙන ගොස් නැත
(ආ)	ප්‍රසම්පාදන කමිටු සහ තාක්ෂණ ඇගයීම් කමිටු සාමාජිකයින්ගේ පැමිණීමේ ලේඛනය	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2	පවත්වාගෙන ගොස් නැත
(ඇ)	ලංසු කැඳවීමේ ලේඛනය	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.1	පවත්වාගෙන ගොස් නැත
(ඈ)	වගකීම් ලේඛනය	මුදල් රෙගුලාසි 214	යාවත්කාලීන කර නොමැත

2. මූල්‍ය සමාලෝචනය

2.1 වැය කළමනාකරණය

පහත කරුණු නිරීක්ෂණය විය

(අ) 2019 වර්ෂයට අදාල අතිකාල සේවා සහ නිවාඩු දින දීමනා සඳහා වැයකර ඇති මුළු එකතුව රු. 5,889,249 ක් පිළිබඳව සලකා බැලීමේ දී සමාලෝචිත වර්ෂයේ දී දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 හි අනුමත සේවක සංඛ්‍යාවට වඩා වැඩියෙන් සිටින බවට නිරීක්ෂණය වුවද 2020 සහ 2021 වර්ෂවලදී ගෙවා ඇති අතිකාල සේවා සහ නිවාඩු දින දීමනා පිළිවෙලින් 48% සිට 86% ක් දක්වා ඉහළ ගොස් ඇති බවට නිරීක්ෂණය විය. තවද, සංසන්දනයේ දී මෙය මුළු එකතුව ලෙස රු. 8,255,221 ක් ලෙස නැතහොත් 40% කින් ඉහළ ගොස් ඇති අතර මෙය 2022 මැයි 25 දිනැති අංක 10/2022 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02 වන ඡේදයේ සඳහන් උපදෙස්වලට පටහැනි බව නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ දී දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විවිධ අංශවල සේවය කරන නිලධාරීන් සඳහා හරිත දේශයක් ගෙවතු වගා ව්‍යාපෘතිය, ග්‍රාමීය සංවර්ධන වැඩසටහන්, ප්‍රදේශීය සංවර්ධන වැඩසටහන් සහ ජීවනෝපාය මාර්ග සංවර්ධන වැඩසටහන් ආදී කරුණු සඳහා ලබා දී තිබූ පරිපාලන වැය විෂයය යටතේ එකී කරුණුවලට සම්බන්ධ නොවන රාජකාරීන් ඉටුකිරීම් වෙනුවෙන් අතිකාල සේවා සහ නිවාඩු දින දීමනා ලෙස අවස්ථා 25 කදී රු. 836,346 ක් ගෙවා ඇති බවට නිරීක්ෂණය විය.

2.2 වගකීම් සහ සීමාවන්ට අනුගත වීම

සමාලෝචිත වර්ෂයේ දී වගකීම් සහ සීමාවන්ට අනුගත වීමෙන් තොරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ පුදුකුඩියිරුප්පු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් 2023 ජනවාරි සහ 2022 දෙසැම්බර් යන මාසයන් සඳහා නිලධාරීන් සඳහා වන ගමන් වියදම් දීමනා, වාහන පිරිසිදු කිරීමේ ගෙවීම්, වාහන රක්ෂණ ගාස්තු, දුරකථන ගාස්තු, ආරක්ෂක සේවා සහ පිරිසිදු කිරීමේ සේවා සඳහා ගෙවීම් ලෙස අවස්ථා 13 ක දී මුළු එකතුව රු. 480,139 ක් ගෙවා ඇති බවට නිරීක්ෂණය විය.

2.3 අනෙකුත් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු මඟින් ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන භාවිතය

(අ) පුනරාවර්තන වියදම්

සමාලෝචිත වර්ෂයේ දී පුනරාවර්තන වියදම් ලෙස වැය ශීර්ෂ 21 ක් යටතේ වෙන්කරන ලද ප්‍රතිපාදන අතරින් සියයට 3 සිට සියයට 86 දක්වා ප්‍රමාණවලින් මුළු එකතුව ලෙස රු. 5,990,501 ක මුදලක් ඉතිරිව තිබෙන බවට නිරීක්ෂණය විය.

(ආ) ප්‍රාග්ධන වියදම්

සමාලෝචිත වර්ෂයේ දී ප්‍රාග්ධන වියදම් ලෙස වැය ශීර්ෂ 08 ක් යටතේ වෙන්කරන ලද ප්‍රතිපාදන අතරින් සියයට 1 සිට සියයට 100 දක්වා ප්‍රමාණවලින් මුළු එකතුව ලෙස රු. 1,070,421 ක මුදලක් ඉතිරිව තිබෙන බවට නිරීක්ෂණය විය.

2.4 නීතිරීති සහ සීමාවන්ට අනනුකූල වීම

නීති රීති, සීමාවන් සහ කළමනාකරණ තීරණ සමඟ වන සම්බන්ධතා	වටිනාකම (රු.)	අනනුකූලතාවය
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූල්‍ය රෙගුලාසි		
(i) අංක 136, 137 සහ 138	1,033,210	එක් සැපයුම්කරුවකු වෙත ගෙවීම සඳහා 2022 දෙසැම්බර් 30 වන දින වෙක්පත් දෙකක් සකස් කර තිබුණ ද එම සැපයුම්කරුවකු විසින් අදාල කාර්යයන් නිමා කර නොතිබීම හේතුවෙන් එම වෙක්පත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගිණුම් ශාඛාවේ මේ දක්වාම රඳවා තබාගෙන ඇති බව නිරීක්ෂණය විය.
(ii) අංක 571	2,632,447	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් අදාල අරමුණු සඳහා උපයෝගී කර නොගත් සහ කල් ඉකුත්ව ඇති තැන්පතු සම්බන්ධව නිසි පියවර නොගැනීම හේතුවෙන් ගෙවීගිය වර්ෂ 02 සිට 04 ක් තිස්සේ පොදු තැන්පතු ගිණුමේ රඳවා තබා ඇත.
(iii) 702 (3)		දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 මඟින් ක්‍රියාත්මක කර තිබූ විවිධ කොන්ත්‍රාත් ගිවිසුම්වල පිටපත් පසුගිය

		වසර 05 ක් තිස්සේම විගණනයට ඉදිරිපත් කිරීමට පියවර ගෙන නොතිබීම හේතුවෙන් එම ව්‍යාපෘතිවල පූර්ව කටයුතු සහ එහි වැඩපිළිවෙල සම්බන්ධව ප්‍රමාණවත් විගණන පරීක්ෂණයක් සිදුකිරීමට නොහැකි විය.
(iv) අංක 757	-	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සමාලෝචිත වර්ෂය සඳහා වන වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේ දී හඳුනාගත් භාණ්ඩ 22 ක ඌණතා සහ භාණ්ඩ 67 ක අතිරික්තය සම්බන්ධයෙන් මේ දක්වාම නිසි පියවර ගෙන නොමැත.

(ආ) වත්කම් කළමනාකරණ වක්‍රලේඛය

2018 දෙසැම්බර් 31 දිනැති අංක 04/2018 හි 03 ඡේදය	11,666,776	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 විසින් භාවිතා කළ කාර්යාල උපකරණ අතරින් එකක් රු. 5000 ට වඩා අඩු වටිනාකම් සහිත භාණ්ඩ 5822 ක් තවදුරටත් මූල්‍ය නොවන වත්කම් ලෙස පෙන්නුම් කර තිබුනි.

(ඇ) ආයතන **සංග්‍රහයේ** XXIV පරිච්ඡේදයේ 4 වන වගන්තිය	122,391	සේවය අවසන් කරන ලද, එක් නිලධාරියකුගේ ණය මුදල් අය කර ගැනීම සඳහා පුදුකුඩියිරුප්පු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් ගෙවීගිය වසර 05 කට අධික කාලයක් තිස්සේ නිසි පියවර ගෙන නොතිබුනි.

2.5 අත්තිකාරම් ගෙවීම සහ නිරවුල් කිරීම

ගොවීන්ගෙන් වී මිලදී ගෙන අලෙවි කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් කිසිදු ගිවිසුමකින් තොරව වී මිලදී ගැනීම සඳහා එක් විවිධ සේවා සමූපකාර සමිති දෙකකට 2015 වර්ෂයේ දී ලබාදෙන ලද මුළු වටිනාකම රු. 20,729,785 ක වී මිලදී ගැනීමේ අත්තිකාරම් මුදලින් මුළු වටිනාකම රු. 17,634,125 ක් නැතහොත් 85% ක් 2023 මාර්තු 31 දක්වා නිරවුල් කර නොතිබුනි.

2.6 තැන්පතු

2012 මැයි 31 දින සිමාසහිත ලංකා ඛනිජ වැලි සමාගම මගින් ඉඩම් මිලදී ගැනීමක් සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබාදී තිබූ රු. 2,250,000 ක මුදල ගෙවීගිය වසර 10 කට අධික කාලයක් තිස්සේ සුදුසු ඉඩමක් පවරා නොදීම හේතුවෙන් නිසි පියවරක් නොමැතිව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පොදු තැන්පතු ගිණුමේ රඳවා තබා ඇත.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

3.1.1 සැලසුම් කිරීම්

සමාලෝචිත වර්ෂයේදීත් ඊට ආසන්න පෙර වර්ෂයේදීත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයේ අංක 03 ඡේදයට අදාලව නියම කර තිබූ ආකෘති පත්‍රවල ව්‍යාපෘති සැලසුම්, ප්‍රසම්පාදන සැලසුම්, අභ්‍යන්තර විගණන වැඩපිළිවෙල සහ මානව සම්පත් සංවර්ධන සැලසුම් ආදිය ඇතුලත් වාර්ෂික වැඩසටහන් සැලැස්ම සකස් කර ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අනුමැතිය ලබාගෙන කටයුතු කර නොමැත.

3.1.2 අපේක්ෂිත නිමැවුම් (Outcome) හිමිකර නොගැනීම

පහත කරුණු නිරීක්ෂණය විය

(අ) විවිධ ව්‍යාපෘති 12 ක් යටතේ ප්‍රතිපාදන ලබාගෙන මාන්තෙයි නැගෙනහිර, ඔට්ටුසුඩ්ඩාන්, තුණුක්කායි සහ මුහුදුබඩපත්තු යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් මුළු එකතුව රු. මිලියන 183.9 ක වියදමින් ඉදිකිරීම් කර ජනතාවට ලබාදුන් නිවාස 118 ක් ගතවූ වසර 06 සිට 10 දක්වා කාලයක් භාවිතයට ගෙන නොමැති බව පෙනී ගිය අතර මේ සම්බන්ධව අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් සිදුකළ යුතුව තිබූ පසු විපරම් කටයුතු ද මේ දක්වා සිදු කර නොමැත.

(ආ) ජාතික උරුමාරක්ෂණ අධිකාරිය මඟින් ලබාගෙන තිබූ මූල්‍ය ප්‍රතිපාදනයෙන් මුළු එකතුව රු. මිලියන 24.19 ක් යොදාගෙන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2014 දෙසැම්බර් 26 වන දින සෙල්වපුරම්හි පිහිටුවන ලද අනාරක්ෂිත සහ අතවරයන්ට ලක්වූ ළමුන් සඳහා වන ආරක්ෂක මධ්‍යස්ථානයේ 481 දෙනකුට නවාතැන් පහසුකම් පැවතියද ගතවූ වසර 08 ක් තිස්සේ එම ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිලාභ ලබාගෙන නොමැති බව පෙනී ගියේය.

(ඇ) 2020 වර්ෂයේ දී සපිරි ගමක් වැඩසටහන යටතේ ඔට්ටුසුඩ්ඩාන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් රු. මිලියන 1.48 ක් වැය කර තෙල් නිෂ්පාදන යන්ත්‍ර මිලදීගෙන තිබුනද ඒවා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය අධිබල විදුලි සම්බන්ධතා නොමැති තිරුමුරුකණ්ඩි ග්‍රාම සංවර්ධන සමිතිය වෙත එම යන්ත්‍ර ලබාදීම හේතුවෙන් ඒවා අපේක්ෂිත අරමුණුවලට අනුව භාවිතා නොකර හානි විය හැකි තත්වයේ පවතින බව පෙනී ගියේය.

3.2 වත්කම් කළමනාකරණය

පහත කරුණු නිරීක්ෂණය විය

(අ) ආපදා කළමනාකරණ අමාත්‍යාංශය මඟින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබාදෙන ලද විදුලි ජනක යන්ත්‍රයක් වසර 06 ක් තිස්සේ භාවිතයට ගෙන නොමැති අතර, 2016 දෙසැම්බර් මාසයේ දී රු. මිලියන 9.8 කට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන විදුලි සැපයුම සඳහා පමණක් භාවිතා කිරීමට කිලෝවොට් 502 (502 kw) ප්‍රමාණයේ වෙනත් ලද විදුලි ජනක යන්ත්‍රයක් ගතවූ වසර 06 ක කාලය තුල පැය 385 ක් පමණක් භාවිතයට ගෙන තිබිය දී එහි change over උපාංගය අක්‍රීයව ඇති බැවින් අලුත්වැඩියා කළ යුතු තත්වයේ පවතී.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ තුණුක්කායි, පුදුකුඩිඉරුප්පු, වැලිඔය, ඔට්ටුසුඩ්ඩාන් යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල භාවිතයේ පවතින වාහන 13 ක හිමිකම් මාරු කිරීමට නිසි පියවර නොගෙනම ඒවා වසර 05 ක් තිස්සේ භාවිතයට ගෙන ඇති බව නිරීක්ෂණය විය.

(ඇ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පුදුකුඩිඉරුප්පු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ තුණුක්කායි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ භාවිතයට ගෙන වසර 03 කට අධික කාලයක් අබලන්ව භාවිතයට ගත නොහැකි තත්වයේ ඇති වාහන 15 ක් භාවිතයට ගත හැකි පරිදි අළුත්වැඩියා කිරීමට මේ දක්වා අවශ්‍ය පියවර ගෙන නොමැත.

(ඈ) 2019 දෙසැම්බර් 10 දින මුල්ලියවලෙයිහි පිහිටි ලෝක ආහාර වැඩසටහන් ගබඩාවේ කටයුතු සඳහා යොදවා තිබූ යතුරු පැදි 06 ක් සහ ලොරි 02 ක් අතරින් යතුරු පැදි 03 ක් පාසැල් වෙත ලබාදෙන ලදී.

එසේ වුවද ඉතිරි යතුරු පැදි 03 සහ ලොරි 02 හි වර්තමාන තත්වය පිළිබඳව විගණනයට කරුණු ඉදිරිපත් කර නොමැත.

3.3 රාජ්‍ය නිලධාරීන්ගේ ඇප තැන්පතු

ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ 2022 මාර්තු 16 දිනැති අංක 04/2020 දරන චක්‍රලේඛයට අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 හි ඇප මුදල් තැන්පත් කළ යුතු නිලධාරීන් 27 දෙනකුගෙන් ලබාගත යුතුව තිබූ ඇප මුදල් ලෙස මුළු එකතුව රු. 294,000 ක් මේ දක්වාම ලබාගැනීමට නිසි පියවර ගෙන නොමැත.

3.4 පාඩු සහ අලාභහානි

පහත කරුණු නිරීක්ෂණය විය

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිල වාහන 05 ක් සඳහා 2019 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වන කාල සීමාව තුලදී සිදුවූ අනතුරු හේතුවෙන් කිරීමට සිදුවූ අළුත්වැඩියාවන් තමන් විසින්ම කිරීම හේතුවෙන් රු. 1,391,124 ක පාඩුවක් සිදුව ඉන් රු. 664,783 ක් රක්ෂණ වන්දි මඟින් ප්‍රතිපූර්ණය කර ගැනීමෙන් පසුව ඉතිරි රු. 726,341 ක මුදල ගත වූ 2019 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලය සඳහා වන ප්‍රාග්ධන වත්කම් ප්‍රතිපාදනයෙන් ලබාගෙන ඇත. කෙසේ වුවද එවන් අලාභයන්හි අගය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පාඩු සහ කපාහැරීම් පිළිබඳ ලේඛනයේ පෙන්නුම් කර නොමැත.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සවිකර තිබූ අකුණු සන්නායකය අක්‍රියව පැවතීම හේතුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විවිධ අංශයන්හි භාවිතයේ පැවති පරිගණක සහ පරිගණක උපකරණ 29 ක්, ඡායා පිටපත් යන්ත්‍ර 02 ක්, සහ තවත් උපකරණ 14 ක් 2023 පෙබරවාරි 28 වන දින පැවති අකුණු සැර හේතුවෙන් සම්පූර්ණයෙන්ම හානියට පත්ව ඇති බව නිරීක්ෂණය විය. එසේ වුවද එම යන්ත්‍රෝපකරණ සියල්ලෙහිම වටිනාකම විගණනයට ලැබී නොතිබුණි. තවද, මේවා අළුත්වැඩියා කිරීම සඳහා සම්පූර්ණ ලෙස රු. 1,990,000 ක ඇස්තමේන්තුවක් 2023 මාර්තු 15 දින දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇත. කෙසේ වුවද අකුණු සන්නායකය ක්‍රියාත්මක වන පරිදි පවත්වාගෙන යාම තුලින් ජීවිත මෙන්ම දේපල හානි සහ සම්පත්වලට සිදුවිය හැකි මෙම

ස්වභාවික ආපදා වලක්වා ගැනීමට අවශ්‍ය පියවර ගැනීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මේ දක්වාම අපොහොසක් වී ඇත.

3.5 විසඳා නොමැති විගණන කරුණු

පහත කරුණු අනාවරණය විය

(අ) 2019 සැප්තැම්බර් 10 දින මුල්ලියවලෙයිහි පිහිටා තිබූ ලෝක ආහාර වැඩසටහන් ගබඩාවේ සිදුකරන ලද ස්ථානීය විගණනයට භාජනය කරන ලද යන්ත්‍රෝපකරණ වර්ග 66 ක්, කාර්යාලයීය උපකරණ, විදුලි උපකරණ, ගෘහ භාණ්ඩ, පරිගණක සහ උපාංග ආදියෙහි වර්ග 37 ක ඒකක 1,517 ක් නිරීක්ෂණය සඳහා ලැබී නොතිබුනි. තවද, එම ගබඩාවේ වෙනත් වර්ග 17 ක ඒකක 515 ක් 2023 පෙබරවාරි මාසයේ දී දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක ගබඩා වෙත ලබා දී තිබුනද ඒ සම්බන්ධය අනුගමනය කළ යුතු කාර්ය පටිපාටින් ක්‍රියාත්මක නොකර තවදුරටත් රඳවා තබාගෙන ඇත.

(ආ) තුණුක්කායි සහ පුදුකුඩියිරුප්පු ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත 2019 වර්ෂයේදී ලබාදෙන ලද ජල බවුසර දෙකක් ගතවූ වසර 03 ක් තිස්සේ නියමිත කාර්යයන්ට යොදා නොගෙන රථ ගාලෙහි අබලන් විය හැකි ආකාරයට රඳවා ඇත.

3.6 සැක සහිත ගනුදෙනු

ඔට්ටුසුඩ්ඩාන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව, උතුරු පළාත් ඉඩම් කළමනාකරණ දෙපාර්තමේන්තුව සහ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව යන ආයතනයන්ට අදාල රාජකාරී කටයුතුවල නිරතව සිටි සංවර්ධන නිලධාරීන් 03 දෙනකු 2019 ඔක්තෝබර්, 2022 ජනවාරි සහ මාර්තු මාසයන්ට පසුව ප්‍රාදේශීය ලේකම්වරයාගේ පූර්ව අනුමැතිය ලබාගැනීමෙන් තොරව දිගින් දිගටම සේවයට වාර්තා කිරීම පැහැර හැර ඇත. එසේ වුවද අදාල ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නියමිත පරිදි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත නියමිත කාලයේදී මේ පිළිබඳව දැනුම් නොදී

මාස 02 සිට මාස 31 ක් දක්වා කාලයක් ප්‍රමාද කර දැනුම් දීම හේතුවෙන් ඔවුන් වෙත රාජකාරියට වාර්තා කර නොමැති ඉහත කාල සීමාවන් සඳහා කාර්ය මණ්ඩල වේතන ආදිය ගෙවීමට ඉඩකඩ තිබීම නිරීක්ෂණය විය. කෙසේ වුවද එවන් වැටුප් ගෙවීම් පිළිබඳ කරුණු විගණනයට ලැබී නොතිබුනි.

3.7 කළමනාකරණ දුර්වලතා

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 කට අයත් ඉඩම් ලෙස මූල්‍ය ප්‍රකාශයන්හි පෙන්නුම් කෙරෙන ඉඩම්වලට අදාල ඔප්පු හෝ ඉඩම් ලබාදීමේ නියෝග (Vasting Order) සහ ඉඩම්වල පිඹුරුපත් ආදිය වසර 10 කට අධික කාලයක් තිස්සේ ලබාගැනීමට හෝ ඒවායේ සාධාරණ වටිනාකම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශයන්ට ඇතුලත් කිරීමට හෝ නිසි පියවර ගෙන නොතිබුණි.

4. තිරසර සංවර්ධනය

4.1 තිරසර සංවර්ධන ඉලක්ක හඳුනා ගැනීම

2017 වර්ෂයේ අංක 01 දරන තිරසර සංවර්ධන පනතට අනුව තිරසර සංවර්ධන ඉලක්ක (2030 වර්ෂයේදී පමණ) සපුරා ගැනීමේ අරමුණින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් වාර්ෂිකව සපුරාගත යුතු ඉලක්ක, එම ඉලක්ක සපුරා ගැනීම සඳහා ක්‍රියාත්මක කළ යුතු කරුණු සහ ඒවායේ ප්‍රගතිය මැන බැලීම සඳහා වන උපදෙස් ආදිය වසර 05 ක් තිස්සේ හඳුනාගෙන ක්‍රියාත්මක කිරීම සඳහා වන පියවර ගෙන නොමැත.

5. මානව සම්පත් කළමනාකරණය

5.1 අනුමත සේවක සංඛ්‍යාව, සේවයේ නිරත සේවක සංඛ්‍යාව සහ කාර්ය මණ්ඩල වේතන

සඳහා වන වියදම්

මුදල් අමාත්‍යාංශයේ 2021 ජූලි 28 දිනැති ජාතික අයවැය සැලසුම් චක්‍රලේඛ අංක 01/2021 හි 2.2 (අ) ඡේදයට පටහැනිව අතිරික්ත කාර්ය මණ්ඩලය ලෙස හඳුනාගත් සංවර්ධන නිලධාරීන් 256 දෙනකු 2022 ජනවාරි මස 03 දින සිට පත්වීම් ලබාදී මේ දක්වාම කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එම තනතුරු අනුමත කිරීමක් සිදු නොකර සමාලෝචිත වර්ෂයේ 2021 ජූලි 01 වන දින සිට අනුමත කර ඇති අනෙකුත් තනතුරු සඳහා ලබාදෙන ලද වේතන ආදිය පුරප්පාඩු ලෙස පැවති එම තනතුරු සඳහා වෙන්කර තිබූ මූල්‍ය ප්‍රතිපාදන භාවිතා කර ඉහත අතිරික්ත කාර්ය මණ්ඩලය සඳහා මුළු එකතුව රු. 11,978,240 ක මුදලක් ඔවුන් සඳහා වන වේතන ආදී ගෙවීම් ලෙස දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 විසින් සිදුකර තිබුනි.

අත්සන
පී. පටිකුනම්
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පරිච්ඡේදය 04

කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

නිශ්චිත දර්ශක	ලබාගත් නිමැවුම අපේක්ෂිත නිමැවුමෙහි ප්‍රතිශතයක් (%) ලෙස		
	100 - 90	75 - 89	50 - 74
නිවාස ආධාර ලබාදීම	✓		
සමෘද්ධි වැඩසටහන යටතට ඇතුලත් කළ පවුල් සංඛ්‍යාව	✓		
ගෙවතු සකස් කිරීම	✓		
ජලාශ අළුත්වැඩියාව	✓		
සෞඛ්‍ය ආයතන සඳහා නව ගොඩනැගිලි ඉදිකිරීම	✓		
සෞඛ්‍ය මධ්‍යස්ථානවල පහසුකම් වැඩිදියුණු කිරීම	✓		
නවීන පන්ති කාමර ඉදිකිරීම / අළුත්වැඩියාව	✓		
ජල පවිත්‍රාගාර ආරම්භ කිරීම	✓		
නොමිලේ විදුලිබල සම්බන්ධතා ලබාදීම	✓		
ග්‍රාමීය මාර්ග අළුත්වැඩියාව	✓		
ක්‍රීඩා පිටි අළුත්වැඩියාව	✓		

පරිච්ඡේදය 05

තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු පිළිවෙලින් දක්වන්න

අභිමතාර්ථ / අරමුණ	ඉලක්කය	ජයග්‍රහණ දර්ශක	ප්‍රගතිය		
			0% - 49%	50% - 74%	75%- 100%
01. කුසගිනි නොමැතිවීම	සැමට ආහාර	ගෙවතු 17507 ක් ඇරම්භ කර ඇත. පාරම්පරික ආහාර සපයන ආපන ශාලාවක් විවෘත කර ඇත.			✓
	කෘෂිකාර්මික යටිතල පහසුකම්	වගා බිම් 11 ක් නවීකරණය කර ඇත			✓
02. යහපත් සෞඛ්‍ය සහ යහපැවැත්ම	සෞඛ්‍ය ආයතන වැඩිදියුණු කිරීම්	ග්‍රාමීය සෞඛ්‍ය මධ්‍යස්ථාන 01 ක පහසුකම් වැඩිදියුණු කර ඇත			✓
03. ගුණාත්මක අධ්‍යාපනය	අධ්‍යාපනික පහසුකම් වැඩිදියුණු කිරීම	පන්ති කාමර ගොඩනැගිලි 32 ක් ඉදිකර / අලුත්වැඩියා කර ඇත සුහුරු පන්ති කාමර 06 ක් ඉදිකිරීම පාසැල් 08 ක් සඳහා උපකරණ ලබා දී ඇත			✓
04. පිරිසුදු ජලය සහ සනීපාරක්ෂාව	සනීපාරක්ෂක පහසුකම්	පවුල් 02 ක් සඳහා වැසිකිලි පහසුකම් සකස් කර දී ඇත			✓
	පිරිසුදු ජල පහසුකම්	ප්‍රජා ජල සම්පාදන ව්‍යාපෘති 07 ක් ආරම්භ කිරීම			✓
05. පවිත්‍ර බලශක්තිය ලබාගැනීම	සැමට විදුලිය	විදුලිබල සම්බන්ධතා 04 ක් නොමිලේ ලබාදීම			✓
06. කර්මාන්ත නව්‍යකරණය සහ යටිතල පහසුකම්	පහසු ගමනාගමනය	ග්‍රාමීය මාර්ග කි.මී. 925 ක් නවීකරණය කර ඇත. සොරොව් 05 ක් නවීකරණය කර ඇත. බස්නැවතුම් ස්ථාන 01 ක් ඉදිකර ඇත			✓
07. තිරසර නගර සහ ප්‍රජාවන්	දියුණු විනෝදාස්වාද පහසුකම්	ක්‍රීඩා පිටි 03 ක් අලුත්වැඩියා කිරීම			✓

5. 2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරාගැනීමේලා වන ජයග්‍රහණ සහ අභියෝග කෙටියෙන් පැහැදිලි කරන්න

සංවර්ධන වැඩසටහන් තිරසර දීර්ඝ කාලීන ව්‍යවහාරයන් බවට පරිවර්තනය කිරීමේ දේශපාලන කැමැත්ත, උද්ධමනය, දේශගුණික අර්බුද, ඉහළ යන අසමානතාවයන්, පසුගාමී සමාජ කණ්ඩායම්, යුක්තිය සඳහා වන ප්‍රවේශයන් සීමිත වීම, පාරිසරික දූෂණය වැනි සාධක සියල්ල වැදගත් කරුණු ලෙස පවතී.

පරිච්ඡේදය 06

මානව සම්පත් පැතිකඩ

6.1 සේවක කළමනාකරණය

මට්ටම	අනුමත සේවක සංඛ්‍යාව	දැනට සිටින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු / (අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ	37	27	10
තෘතීයික	28	7	21
ද්විතීයික	563	566	253/ (256)
ප්‍රථමික	75	44	31

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න

1. නිලධාරීන්ට අධික රාජකාරි ප්‍රමාණයක් ඉටු කිරීමට සිදුවීම හේතුවෙන් ඔවුන් හට සේවය පිළිබඳව තෘප්තිමත් භාවයක් නොලැබෙන බැවින් ඔවුන් සේවය කෙරෙහි දක්වන උනන්දුව හීනවේ. මෙය ආයතනයේ ඉලක්ක සපුරා ගැනීමේදී බලපෑම් ඇති කරයි.

2. දෙවන පෙළ නිලධාරීන්ගේ සමස්ත අතිරික්තයත් නිරීක්ෂණය වුවද එම පෙළෙහිම එක් ශ්‍රේණියක පවතින පුරප්පාඩුවල රාජකාරි සඳහා අතිරික්ත ශ්‍රේණියේ නිලධාරීන් යෙදවීම හේතුවෙන් ද ගැටළුවලට මුහුණ පෑමට සිදුව ඇත. තවද පුරප්පාඩු ආවරණය සඳහා මානව සම්පත් මත අධික වැඩ කොටසක් පැවරී ඇති බැවින්,

    1. මානසික ආතතිය ඇතිවීම
    2. නිසි කාල සීමාවකට අනුව කටයුතු ඉටු කළ නොහැකි වීම
    3. ජනතාව වෙත කඩිනම් සේවාවක් සැපයීම කෙරෙහි බාධා ඇතිවීම

    මෙම හේතූන් මත ආයතනයේ ඉලක්ක සපුරාගැනීමට නොහැකි වන අතරම මෙම නිසා ආයතනයේ සංවර්ධනයටද විවිධාකාර බාධා ඇතිවේ.

    එමෙන්ම, මානව සම්පත් අතිරික්තයක් පැවතීම හේතුවෙන් ;

    අතිරික්ත සේවකයින්ගේ වැටුප් ගෙවීම ඇතුළු අනෙකුත් සියළුම වියදම් සඳහා වන ඇස්තමේන්තු මඟින් ආයතනයේ ආදායමට අහිතකර බලපෑම් ඇතිවන අතරම අතිරික්ත සේවක පිරිස් හේතුවෙන් ආයතන තුල රාජකාරී කටයුතුවලදී අනවශ්‍ය මතභේදාත්මක තත්වයන්ද ඇතිවේ. තවද එය ආයතනයේ කීර්ති නාමයට හානිකර වන අතරම ආයතනයේ කාර්ය සාධනයට අහිතකර බලපෑමක් ඇති කරයි.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩ සටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (රු.)		වැඩ සටහනේ ස්වභාවය (දේශීය / විදේශීය)	නිමැවුම / ලබා ගත් දැනුම
			දේශීය	විදේශීය		
නිලධාරීන්ගේ හැකියා වර්ධනය පිළිබඳ පුහුණු වැඩසටහන	99	දින 2 යි	50,000.00	-	දේශීය	නිලධාරීන්ගේ ඵලදායි රාජකාරි කටයුතු
ඵලදායිතා පුහුණු වැඩසටහන	93	දින 2 යි	50,000.00	-	දේශීය	නිලධාරීන්ගේ ඵලදායි රාජකාරි කටයුතු
පශ්චාත් උපාධි අධ්‍යයන	1	2021/2022	171,500.00	-	දේශීය	සංවර්ධන ආර්ථික විද්‍යාව
නව පත්වීම් ලද සංවර්ධන නිලධාරීන් සඳහා වන උපදෙස් පන්තිය	23	දින 2 යි	-	-	දේශීය	නිලධාරීන්ගේ ඵලදායි රාජකාරි කටයුතු
SYSCGAA කාර්යාල කළමනාකරණය	07	දින 1 යි	-	-	දේශීය	කාර්යාල පරිපාලන ක්‍රම පිළිබඳ දැනුම වර්ධනය
තොරතුරු සන්නිවේදන පුහුණු වැඩසටහන	104	පැය 6 යි	31,260.00	-	දේශීය	තොරතුරු සන්නිවේදනය පිළිබඳ දැනුම වර්ධනය
ව්‍යාපෘති කළමනාකරණ පුහුණු වැඩසටහන	70	පැය 6 යි	28,740.00	-	දේශීය	ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ දැනුම වර්ධනය
සංවර්ධන නිලධාරීන් සඳහා වන හැකියා වර්ධන වැඩසටහන	60	දින 5 යි	102,300.00	-	දේශීය	මුදල් රෙගුලාසි, කාර්යාල ක්‍රම, සන්නිවේදන තාක්ෂණය සම්බන්ධ දැනුම
නව පත්වීම් ලද සංවර්ධන නිලධාරීන් සඳහා වන උපදෙස් පන්තිය	160	දින 2 යි	110,210.00	-	දේශීය	මුදල් රෙගුලාසි, කාර්යාල ක්‍රම, සන්නිවේදන තාක්ෂණය, යහපත් ආකල්ප, ශරීර සෞඛ්‍යය, සැලසුම් කළමනාකරණ,

						ආපදා කළමනාකරණ, ඵලදායිතාව, දෙවන බස සම්බන්ධ දැනුම
SYSCGAA කාර්යාල කළමනාකරණය පිළිබඳ පුහුණුව	70	දින 1 යි	29,600.00	-	දේශීය	SYSCGAA කාර්යාල කළමනාකරණය පිළිබඳ කරුණු
ප්‍රථමාධාර පුහුණුව	40	දින 1 යි	16,800.00	-	දේශීය	ප්‍රථමාධාර පිළිබඳ මූලික දැනුම
අභ්‍යන්තර විගණනය පිළිබඳ පුහුණුව	40	දින 1 යි	20,600.00	-	දේශීය	අභ්‍යන්තර විගණනය පිළිබඳ කරුණු
ITMIS ගිණුම් ක්‍රමවේදය පිළිබඳ පුහුණුව	30	දින 4 යි	128,011.00	-	දේශීය	ITMIS කාර්යාල කළමනාකරණය පිළිබඳ කරුණු
මාණ්ඩලික නිලධාරීන් සඳහා වන හැකියා සංවර්ධන වැඩසටහන	80	දින 2 යි	65,800.00	-	දේශීය	හැකියා සංවර්ධනය පිළිබඳ කරුණු
කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට පෙනී සිටින නිලධාරීන් සඳහා වන පුහුණුව	40	දින 1 යි	28,000.00	-	දේශීය	කාර්යක්ෂමතා දැනුම
කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට පෙනී සිටින නිලධාරීන් සඳහා වන පුහුණුව	45	දින 1 යි	23,025.00	-	දේශීය	කාර්යක්ෂමතා දැනුම
ධනාත්මක චින්තනය පිළිබඳ පුහුණු වැඩසටහන	40	දින 1 යි	48,975.00	-	දේශීය	ධනාත්මක චින්තනය පිළිබඳ දැනුම
කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට පෙනී සිටින නිලධාරීන් සඳහා වන	53	දින 1 යි	32,430.00	-	දේශීය	කාර්යක්ෂමතා දැනුම

පුහුණුව						
කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට පෙනී සිටින නිලධාරීන් සඳහා වන පුහුණුව	36	දින 1 යි	9,480.00	-	දේශීය	කාර්යක්ෂමතා දැනුම
Microsoft Access දත්ත පද්ධති පුහුණු වැඩසටහන	25	දින 3 යි	15,900.00	-	දේශීය	නිලධාරීන්ගේ පරිගණක දැනුම වර්ධනය තුලින් කාර්යාල රාජකාරි කටයුතු කාර්යක්ෂම ලෙස සහ සාර්ථක ලෙස ඉටු කිරීමට හැකිවිය
කාර්යාල ක්‍රම පුහුණු වැඩසටහන	20	දින 1 යි	2,500.00	-	දේශීය	කාර්යාල රාජකාරි කටයුතු කාර්යක්ෂම ලෙස සහ සාර්ථක ලෙස ඉටු කිරීමේ හැකියාව
හැකියා සංවර්ධන පුහුණු වැඩසටහන	20	දින 1 යි	22,800.00	-	දේශීය	නිලධාරීන්ගේ හැකියාවන් වර්ධනය මඟින් කාර්යාල රාජකාරි කටයුතු කාර්යක්ෂම ලෙස සහ සාර්ථක ලෙස ඉටු කිරීමට හැකිවිය.
හැකියා සංවර්ධන පුහුණු වැඩසටහන	20	දින 1 යි	18,200.00	-	දේශීය	නිලධාරීන්ගේ හැකියාවන් වර්ධනය කිරීම තුලින් කාර්යාල කටයුතු කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස ඉටුකිරීමේ හැකි විය
TSC ක්‍රියාමාර්ග සම්බන්ධ පුහුණු වැඩසටහන	20	දින 1 යි	20,100.00	-	දේශීය	කාර්යාල කටයුතු කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස ඉටුකිරීමේ හැකියාව
TSC ක්‍රියාමාර්ග සම්බන්ධ පුහුණු වැඩසටහන	20	දින 1 යි	19,600.00	-	දේශීය	කාර්යාල කටයුතු කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස ඉටුකිරීමේ හැකියාව්
TSC ක්‍රියාමාර්ග සම්බන්ධ පුහුණු වැඩසටහන	20	දින 1 යි	19,600.00	-	දේශීය	කාර්යාල කටයුතු කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස ඉටුකිරීමේ

						හැකියාව
විනය කාර්ය පටිපාටිය	30	දින 2 යි	40,100.00	-	දේශීය	විනය කාර්ය පටිපාටිය පිළිබඳ දැනුම
කාර්යාල ක්‍රම සහ සන්නිවේදන තාක්ෂණය	30	දින 2 යි	40,100.00	-	දේශීය	කාර්යාල ක්‍රම සහ සන්නිවේදන තාක්ෂණය පිළිබඳ දැනුම
පශ්චාත් උපාධි අධ්‍යාපන - ගණකාධිකාරී	1	2021/2022	140,000.00	-	දේශීය	සංවර්ධන ආර්ථික විද්‍යාව
පවුල තුල දී සහ කාර්යාල තුල දී ඇතිවන මානසික පීඩනයන් පාලනය කර ගැනීම	45	පැය 4 යි	14,155.00		දේශීය	මානසික පීඩනයන් පාලනය කර ගැනීම පිළිබඳ දැනුම
පරිගණක පුහුණුව	60	පැය 6 යි	25,845.00		දේශීය	සන්නිවේදන තාක්ෂණය පිළිබඳ දැනුම වර්ධනය විය
කාර්යාල ක්‍රම පුහුණු වැඩසටහන	60	පැය 6 යි	25,000.00		දේශීය	කාර්යාල ක්‍රම පිළිබඳ දැනුම වර්ධනය විය

පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ආයතනයේ කාර්ය සාධනය කෙරෙහි දක්වන දායකත්වය කෙටියෙන් පැහැදිලි කරන්න

ඉහත සඳහන් කර ඇති පුහුණු වැඩසටහන් තුලින් නිලධාරීන්ගේ හැකියාවන් වර්ධනය කර ඇති අතරම ඔවුන්ගේ විෂය දැනුම ද වර්ධනය කර ඇත. මෙම කටයුතු මඟින් ඔවුන්ගේ කාර්යක්ෂමතාව සහ දැනුම් මට්ටම ඉහළ නැංවී ඇති බැවින් ආයතනය මඟින් මහජනතාවට මෙන්ම අනෙකුත් අභ්‍යන්තර ආයතන වෙත සැපයෙන සේවාවන්ද කඩිනම් කර ඇත.

එමෙන්ම මෙම පුහුණු වැඩසටහන් තුලින් නිලධාරීන් ස්වකීය කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණවලින් සමත් වන බැවින් එම නිලධාරීන්ගේ සේවය මඟින් ආයතනයද උසස් තත්වයකට පත්ව ඇත.

ආයතනයේ උසස් තත්වය හේතුවෙන් පසුගිය වසරේ පැවැත්වූ ඵලදායිතා තරඟාවලියේ දී තෙවන ස්ථානයේ සිට දෙවන ස්ථානය දක්වා ඉදිරියට පැමිණ ඇති අතර වාර්ෂික ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීමෙන්ද පළමු ස්ථානය රඳවා ගෙන ඇත.

පරිච්ඡේදය-07

අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීම සඳහා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග යෝජනා
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	-		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	-		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	-		
1.6	වෙනත්	-		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත් කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

2.11	උප පත්‍රිකා පොත් ලේඛන (GA - N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	ආයතනය තුළ මූල්‍ය බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.4	2014-05-11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව ගණකාධිකාරිවරුන් විසින් රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීම පිළිබඳව පාලනයන්ට අනුගත වීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134 (2) DMA/ 1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයාගේ උපදෙස් සහිතව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කර තිබීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් ඇතුළත දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40 (4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

6.4	මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තබීම	අනුකූල වේ		
7	විගණන හා කළමනාකරණ කමිටු			
7.1	කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 1-2019 අනුව, අදාළ වර්ෂය තුළ අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	වත්කම් මිල දී ගැනීම හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේදී අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ පිළිබඳව චක්‍රලේඛයේ සඳහන් කාල සීමාව තුළ කටයුතු සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	මු.රෙ. 772 අනුව ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම සිදුකිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහනය සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී ඒවා අපහරණය කර තිබීම	-		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		

9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016-12-29 දිනැති අංක 30/2016 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම් නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල් බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර, සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන සීමාවන් ඉක්මවා නොයන පරිදි ඒවාට අදාල වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්ම වන පරිදි බැරකම්වලට එළැඹීම	අනුකූල වේ		
12	**රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වසර එකක වැඩි කාලයක් හිඟ පවතින ණය පියවීම	අනුකූල වේ		පියවීම් සඳහා අනුමැතිය සහිත ලිපිය ලැබී ඇත
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර කිරීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම්**			
15.1	රැස් කළ ආදායමෙන් අදාළ රෙගුලාසිවලට අනුකූලව ආපසු ගෙවීම් සිදුකොට තිබීම	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායම් ගිණුමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ		
16.3	20-09-2017 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන	අනුකූල වේ		

	වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම			
18	**පුරවැසි ප්‍රඥාප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2018 සහ අංක 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි සේවාලාභී ප්‍රඥාප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදයේ පරිදි, පුරවැසි සේවාලාභී ප්‍රඥාප්තියක් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන අංක 02/2018 හි ඇමුණුම 02 හි සඳහන් ආකෘතිය පදනම් කර ගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කර ගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ අංක 6.5 ඡේදයේ ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධනය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ නිපුණතා සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

අවසන්